උප්පැන්න ලේඛනයේ නම (2 තීරය) වෙනස් කිරීම

- අවශ්‍ය ආකෘති (මෙම ආකෘති බාගත කරගත හැක);

*<u>වයස අවු. 21ට අඩු</u> -

1.27 වගන්ති ප්‍රකාශය - බී 9 ආකෘතිය (ප්‍රකාශක - මව/පියා/භාරකරු),

2.දිවුරුම් ප්‍රකාශ ආකෘතිය -1

3.තොරතුරු ලබා ගැනීමේ අයදුම්පත (ඇමුණුම 1)

* <u>වයස අවු. 21ට වැඩි</u> -

1.27 වගන්තිය -බී 10 ආකෘතිය (ප්‍රකාශක - උප්පැන්නය අයත් අය)

2.දිවුරුම් ප්‍රකාශ ආකෘතිය -2

3.තොරතුරු ලබා ගැනීමේ අයදුම්පත(ඇමුණුම 2)

- ගාස්තුව - රු.60.00

- 27 වගන්ති ප්‍රකාශය සමඟ ඉදිරිපත් කල යුතු අනෙකුත් ලේඛන;

1.වයස අවු. 07ට අඩු;

1.සංශෝධනය කල යුතු උප්පැනයේ ප්‍රා.ලේ.කා.න් ලබා ගත් සහතිකය

2.දෙමාපියන්ගේ ඉල්ලීම් ලිපිය / දිවුරුම් ප්‍රකාශය

3.දෙමාපියන්ගේ ජාතික හැඳුනුම්පත්හි සහතික පිටපත්

4.ප්‍රකාශක විසින් ග්‍රාම නිළධාරීගෙන් ලබා ගත් පදිංචි සහතිකය

2. වයස අවු.07-16 අතර;

1.සංශෝධනය කල යුතු උප්පැනයේ ප්‍රා.ලේ.කා.න් ලබා ගත් සහතිකය

2.දෙමාපියන්ගේ ඉල්ලීම් ලිපිය

3.දෙමාපියන්ගේ ජාතික හැඳුනුම්පත්හි සහතික පිටපත්

4.ප්‍රකාශකගේ දිවුරුම් ප්‍රකාශය

5.ප්‍රකාශක විසින් ග්‍රාම නිළධාරීගෙන් ලබා ගත් පදිංචි සහතිකය

6.දරුවා අධ්‍යාපනය ලබන පාසලෙහි විදුහල්පතිවරයා විසින් අදාල නම භාවිතා කිරීම පිළිබඳ එකඟතාවය දක්වන බවට නිකුත් කර ඇති ලිපිය

7.ඉල්ලුම් කරන නම භාවිතා කළ බව සනාථ කෙරෙනලියවිලි

(තිබේ නම් පමණක්)

3.විදේශයක ස්ථිර පදිංචිය සහිත පුද්ගලයින්;

1.සංශෝධනය කල යුතු උප්පැනයේ ප්‍රා.ලේ.කා.න් ලබා ගත් සහතිකය

2.ප්‍රකාශකගේ ජාතික හැඳුනුම්පතෙහි/විදේශ ගමන් බලපත්‍රයෙහි සහතික පිටපතක්

3.ස්ථිර පදිංචිය/පුරවැසිභාවය සහිත රටෙහි අදාල නම භාවිතා කළ බවට ලිඛිත සාක්ෂි 03

4.ලිපි දෝෂ නිවැරදි කිරීම;

1. .සංශෝධනය කල යුතු උප්පැනයේ ප්‍රා.ලේ.කා.න් ලබා ගත් සහතිකය

2.ප්‍රකාශකගේ ජාතික හැඳුනුම් පතෙහි සහතික පිටපතක්

3. ඉල්ලීම් ලිපිය

4. දිවුරුම් ප්‍රකාශය

5.ඉල්ලුම් කරන නම භාවිතා කළ බව සනාථ කෙරෙන ලියවිලි 03ක්

6.ප්‍රකාශක විසින් ග්‍රාම නිළධාරීගෙන් ලබා ගත් පදිංචි සහතිකය

5.දෙවන තීරයට වාසගම ඇතුල් කිරීම/දෙවන තීරයෙන් වාසගම ඉවත් කිරීම;

1.සංශෝධනය කල යුතු උප්පැනයේ ප්‍රා.ලේ.කා.න් ලබා ගත් සහතිකය

2.ප්‍රකාශකගේ ජාතික හැඳුනුම් පතෙහි සහතික පිටපතක්

3.ප්‍රකාශක විසින්ග්‍රාම නිළධාරීගෙන් ලබා ගත් පදිංචි සහතිකය

4.ඉල්ලුම් කරන නම වසරකට වැඩි කාලයක් භාවිතා කළ බව සනාථ කෙරෙන ලියවිලි 03ක්

6.වෙනත්;

1. .සංශෝධනය කල යුතු උප්පැනයේ ප්‍රා.ලේ.කා.න් ලබා ගත් සහතිකය

2.ප්‍රකාශකගේ ජාතික හැඳුනුම් පතෙහි සහතික පිටපතක්

3.ඉල්ලුම් කරන නම වසරකට වැඩි කාලයක් භාවිතා කළ බව සනාථ කෙරෙන ලියවිලි 03ක්*

4.තොරතුරු ලබා ගැනීමේ අයදුම්පත

5.පුවත් පත් දැන්වීම (පලකර වසරක කාලයක් ඉක්මවා නිබිය යුතුය)*

6. දිවුරුම් ප්‍රකාශය

7.ජාතිය වසන් කිරීමේ අරමුණක් නොමැති බවට කරන දිවුරුම් ප්‍රකාශය (නම සංශෝධනය මගින් වෙනත් ජාතියක් නිරූපණය වීම සිදුවන්නනේ නම් පමණි)

8.ප්‍රකාශක විසින් ග්‍රාම නිළධාරීගෙන් ලබා ගත් පදිංචි සහතිකය

දෙමාපිය විවාහ සහතිකය (දෙමාපියන් ජාතීන් දෙකකට අයත් වන විට, මවගේ හෝ පියාගේ ජාතිය නිරූපණය වන අයුරින් නම සංශෝධනය කිරීමේදී)

* ජාතිය වෙනසකට ලක් නොවන ආකාරයෙන් නමෙහි සැලකිය යුතු වෙනසක් කිරීමකදී හෝ,

දෙමාපියන් ජාතීන් දෙකකට අයත් වන විට,මවගේ හෝ පියාගේ ජාතිය නිරූපණය වන අයුරින් නම සංශෝධනය කිරීමේදී පමණක්,

ඉහත 3 හෝ 5 කරුනු දෙකින් එකක් වසරක් ඉක්මවා තිබීම ප්‍රමාණවත් වේ.

- ඔබගේ ගොනුව සංශෝධනය විය යුතු උප්පැන්නය අයත් වන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යොමු කරන්න.